ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	21	S	I	ආර්ථික විද්‍යාව I Economics I	කාලය : පැය දෙකයි Time : Two hours

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්න වලට 1, 2, 3, 4 සහ 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රය මත කතිරයක් යොදා දක්වන්න.

1. පහත දැක්වෙන සිදුවීම් වලින් සුක්ෂම ආර්ථික විද්‍යාත්මක ගණයට අයත්වන ප්‍රකාශය කුමක්ද ?
   1. ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොළී අනුපාතික පහල දැමීම
   2. රජය සේනා දළඹු ව්‍යාවසනයෙන් හානියට පත් බඩ ඉරිගු ගොවීන්ට වන්දි ලබා දීම.
   3. රජය අය වැය හිඟය පියවීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය ලබා ගැනීම.
   4. ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩ ඇරීම.
   5. ආර්ථික වර්ධනය 5% දක්වා වර්ධනය කිරීම.

2. ආර්ථික සම්පත් ලෙස වර්ග කරනු ලබන දෑ හි මූලික ලක්ෂණයක් නොවන්නේ
   1. සැපයුම සීමා සහිත වීම.
   2. භාවිතයේදී සම්පත් පිරිවැයක් සහිතවීම.
   3. නිෂ්පාදන සාධක සඳහා වෙළඳපළක් පැවතීම.
   4. ආවස්ථික පිරිවැය ශූන්‍ය වීම.
   5. විකල්ප භාවිත සඳහා යොදාගත හැකිවීම.

3. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත ඕනෑම ලක්ෂ්‍යයකදී බැවුම ස්ථාවර වේ නම්.
   1. නිෂ්පාදන හැකියා වක්‍රය මුලයට උත්තලව පිහිටයි.
   2. නිෂ්පාදන සම්පත් විකල්ප භාවිතයන් හීදි පුර්ණ ආදේශණවේ.
   3. මිල වැඩිවන වේගයට සමාන වේගයකින් ඉල්ලුම අඩුවේ.
   4. සෑම විටම එක් භාණ්ඩයකින් නිපදවිය හැක්කේ සාපේක්ෂව අඩු ප්‍රමාණයකි.
   5. නිෂ්පාදනයේ දී භාවිතා කරන තාක්ෂණය වෙනස්වීම.


4. ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍රයන්හි මිල හා නිමවුම වෙළඳපළ යාන්ත්‍රණය මගින් තීරණය වන, රජය වියදම් කිරීම, රෙගුලාසි පැනවීම හා දේපළ හිමිකාරිත්වය රජය සතුවීම මගින් ආර්ථික ක්‍රියාකාරිත්වයට රජය සහභාගිවේ නම් එවැනි ආර්ථිකයක්
   1. සමාජ වෙළඳපළ ආර්ථිකයකි
   2. සමාජවාදී වෙළඳපළ ආර්ථිකයකි.
   3. ධානේශ්වර ආර්ථිකයකි.
   4. විධානගත ආර්ථිකයකි.
   5. සමාජවාදී ආර්ථිකයකි.

5. පහත සඳහන් දෑ අතුරින් ව්‍යුත්පන්න ඉල්ලුමක් පැවතිය හැක්කේ.
   1. පෞද්ගලික මෝටර් රථයක් සඳහා යොදන ඉන්ධන.
   2. ඇදුම් මසන්නකු මිලට ගත් කතුරක් .
   3. පා පැදිකරුවකු ලබාගත් ටයරයක් .
   4. විකුණුම් සහයකයෙකු මිලටගත් ටයි පටියක්.
   5. නිවසට ගෙනයන භූමිතෙල්

6. තරඟකාරී වෙළඳපලක ආලෙවි වන එක්තරා භාණ්ඩයක සමතුලිත මිල වැඩිවී සමතුලිත ප්‍රමාණය අඩුවී ඇත. මෙවැනි ප්‍රතිඵලයක් ජනිත කරනුයේ .
   1. ඉල්ලුම වැඩිවීම හා ඊට වඩා වැඩි වේගයකින් සැපයුම වැඩිවීම.
   2. ඉල්ලුම අඩුවීම හා ඊට වඩා වැඩි වේගයකින් සැපයුම අඩුවීම.
   3. ඉල්ලුම වැඩිවීම හා ඊට සමාන වේගයකින් සැපයුම අඩුවීම.
   4. ඉල්ලුම වැඩිවීම හා ඊට වඩා වැඩි වේගයකින් සැපයුම අඩුවීම.
   5. ඉල්ලුම අඩුවීම හා ඊට සමාන වේගයකින් සැපයුම අඩුවීම.

7. ජංගම දුරකථන සඳහා පවත්නා වෙළඳපළ ඉල්ලුම QD = 8000 - 75P ද සැපයුම QS = - 2000 + 25P දවේ.වෙළඳපළ සැපයුම දුරකථන ප්‍රමාණ ඒකක 275 වුවහොත් ,
   1. රු.150 ක අධි ඉල්ලුම් මිලක් බිහිවේ.
   2. රු.10 ක අධි ඉල්ලුම් මිලක් බිහිවේ.
   3. රු.18 ක අධි ඉල්ලුම් මිලක් බිහිවේ.
   4. රු.12 ක අධි ඉල්ලුම් මිලක් බිහිවේ.
   5. රු 90 ක අධි සැපයුම් මිලක් බිහිවේ.

8. කිසියම් භාණ්ඩයක් වෙළඳපළ සමතුලිතයට පත්වී ඇති ආකාරය පහත රූප සටහනින් දැක්වේ.



මෙම භාණ්ඩයේ යෙදුවුම් මිල ගණන් පහල ගියහොත්

	මිල වෙනස් වීම	පාරිභෝගික අතිරික්තය	නිශ්පාදන අතිරික්තය
01	අඩුවේ	අඩුවේ	වෙනස් නොවේ
02	අඩුවේ	වෙනස් නොවේ	අඩුවේ
03	වැඩිවේ	වැඩිවේ	වැඩිවේ
04	වැඩිවේ	අඩුවේ	අඩුවේ
05	අඩුවේ	වැඩිවේ	අඩුවේ

9. භාණ්ඩයක මිල හා පාරිභෝගික පැහැදම අතර අනුලෝම සම්බන්ධතාවයක් පැවතිය හැක්කේ පහත කුමන අවස්ථාවේදිද ?

   1. පූර්ණ නම්‍ය ඉල්ලුමක් පවතීනම්
   2. අනම්‍ය ඉල්ලුමක් පවතීනම්
   3. නම්‍ය ඉල්ලුමක් පවතීනම්
   4. ඒකීය නම්‍ය ඉල්ලුමක් පවතීනම්
   5. පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතීනම්

10. වෙළඳපළ සමතුලිතව පවතින විට එම මිලට ඉහළ මිල ගණන්වලදී දැකිය හැකි ලක්ෂණය කුමක්ද ?
   1. සැපයුම් කරුවන් සංඛ්‍යාව ඉහල යාම.
   2. වෙළඳපළ සැපයුම් කරුවන් බලවත්වීම.
   3. සපයනු ලබන ප්‍රමාණය ඉහළ යාම.
   4. ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයට වඩා සැපයුම් කරනු ලබන ප්‍රමාණය විශාල වීම.
   5. ඉල්ලුම් කරුවන් සංඛ්‍යාව අඩුවීම.

11. නිෂ්පාදකයින් මත ඒකක බද්ධක් පැනවීම නිසා වෙළඳ පළ මිල සැලකිය යුතු ලෙස ඉහළ යාමක් සිදුවුවත් සමාජය මත අතිරේක බදු බරක් පතිත නොවීය. ඉන් අදහස් වන්නේ බද්ධට යටත්වූ භාණ්ඩයේ,
   1. ඉල්ලුම ඉතා සුළු වශයෙන් වෙනස්වී ඇති බවයි.
   2. ඉල්ලුම හෝ සැපයුම පූර්ණ නම්‍යතාවයකින් යුක්ත බවයි.
   3. ඉල්ලුමට සාපේක්ෂව සැපයුම් මිල අනම්‍යතාවයෙන් යුක්ත බවයි.
   4. ඉල්ලුම හෝ සැපයුම මිල ඉහල යාමට සංවේදී නොමැති බවයි.
   5. ඉල්ලුම ඉතා අඩු මිල නම්‍යතාවයකින් පහළට බෑවුම් වන බවයි.

12. අධි බදු බර පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වන්නේ
    1. සුභසාධනයේ අහිමි වීමයි.
    2. බද්ධට පෙර පාරිභෝගික අතිරික්තයට සහ නිෂ්පාදන අතිරික්තයට අයත් කොටසයි.
    3. වටිනාකම් බද්ධක් අයකළ විට අධිබදු බරක් ඇතිවේ.
    4. සම්පත් බෙදීයාමේ කාර්යක්ශමතාවට බලපෑමක් වන්නේ අධි බදු බරයි.
    5. බද්ධට පසු රජයේ ආදායමට අයත් කොටස වේ.


13. වී සඳහා වෙළඳපලේ පවතින ඉල්ලුම් සැපයුම් සමීකරණ පහත දැක්වේ.

    QD = 600 - 10P , QS = 10P මෙම භාණ්ඩය මත රු.10 ක ඒකක සහනාධාරයක් සැපයීමෙන් පසු ගැනුම්කරු ගෙවන මිල හා නිෂ්පාදකයාට ලැබෙන මිල පිළිවෙලින්,

    1. රු.15 හා රු.35 කි.
    2. රු.20 හා රු.25 කි
    3. රු.25 හා රු.35 කි
    4. රු.30 හා රු35 කි.
    5. රු .25 හාරු.40 කි.

14. කෙටිකාලීන නිෂ්පාදන ආයතනයක විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව උපරිම වී පහල බැස සාමාන්‍ය ඵලදාවට සමාන වන පරාසයේ දී,
    1. සාමාන්‍ය ඵලදාව තවදුරටත් වැඩිවෙමින් පවතී.
    2. සාමාන්‍ය ඵලදාව ආන්තික ඵලදාවට ඉහලින් පිහිටයි.
    3. සාමාන්‍ය ඵලදාව එහි උපරිම අගය ඉක්මවා යයි.
    4. සාමාන්‍ය ඵලදාව පහල බසිමින් පවතී.
    5. සාමාන්‍ය ඵලදාව ස්ථාවර වේගයකින් වැඩිවේ.

15. පහත රූප සටහනේ දැක්වෙන කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ නිමවුම Q1 සිට Q2 දක්වා ප්‍රසාරණය කරන විට ආන්තික පිරිවැය ඉහල යන නමුදු සාමාන්‍ය විචල්‍ය පිරිවැය තවදුරටත් පහල බසිමින් පවතී. එයට හේතුවිය හැක්කේ



    1. මුළු පිරිවැයෙන් වැඩි කොටසකට මුළු ස්ථාවර පිරිවැය වශයෙන් පැවතීමයි.
    2. මුළු පිරිවැය වක්‍රය අඩුවන වේගයකින් ඉහළයාමයි.
    3. Q1 –Q2 නිමවුම් පරාසය තුල විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව ඉහළ නගිමින් පැවතීමයි.
    4. Q1 –Q2 නිමවුම් පරාසය තුල විචල්‍ය යෙදවුමේ සාමාන්‍ය ඵලදාව ඉහළ නැගෙමින් පවතී.
    5. පිරිවැය වක්‍ර දෙකම ඉංග්‍රීසි U හැඩය ගැනීමයි.

16. නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගීවන ශ්‍රමිකයින් 5 දෙනෙකුගේ ශ්‍රම සැපයුම් වක්‍රයේ නම්‍යතාවය පහත දැක්වේ. ඒ අතුරින් ආර්ථික බදු කුලිය අඩු හා සංක්‍රාම ඉපයුම වැඩිම ශ්‍රමිකයා කවුරුන්ද?

	ශ්‍රමිකයා	සැපයුම් නම්‍යතාවය
1.	A	0.24
2.	B	0.90
3.	C	1.06
4.	D	2.05
5.	E	0.07


17. පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක මුළු අයභාරය හා මුළු පිරිවැය පිළිබඳ තොරතුරු පහත වේ.

නිෂ්පාදනය	මුළු අයභාරය	මුළු පිරිවැය
0	0	30
2	40	46
5	100	69
9	180	90
11	220	130
14	280	210
18	360	370

ආයතනයේ ප්‍රශස්ථ නිමවුම් මට්ටම හා ස්ථාවර පිරිවැය වන්නේ,

	මවුම් මට්ටම	ස්ථාවර පිරිවැය
1.	2	20
2.	5	30
3.	9	20
4.	10	30
5.	10	20

18. මු.ද.දේ.නි.



ඉහත රූප සටහනට අනුව A – B දක්වා ආර්ථිකයේ සිදුවන වෙනස් වීමක ප්‍රතිඵලයක් වන්නේ,

1. සේවා වියුක්තිය අඩු වී ජීවන තත්වය ඉහළයාම.
2. විරැකියාව වැඩි වී සෘණ නිමවුම් පරතරයක් ඇතිවීම.
3. ආර්ථික වෘද්ධිය මන්දගාමී වුවද ආදායම් ඉහළයාම
4. වෘද්ධි ක්‍රියාවලිය අඩු වුවද අපනයන අදායම් ඉහළ යාම
5. පහළ වැටෙන මුර්ත නිමුමක් සමඟ ආදායමේ මන්දගාමී වර්ධනයක් ඇතිවීම.

19. දළ දේශීය නිෂ්පාදනය බිහි කිරීමේදී යොදා ගැනෙන ප්‍රාථමික යෙදවුම් හඳුනාගත හැක්කේ,
1. රටකට ස්වභාව ධර්මයෙන් උරුමවී ඇති මුළු සම්පත් තොගය වශයෙනි.
2. ඊළඟ නිවුම් පෝෂණය කරනු ලබන යෙදවුම් වශයෙනි.
3. අවසාන නිමවුමේ කොටසක් බවට පත් නොවන යෙදවුම් වශයෙනි.
4. නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රථම අවධියේදී යොදා ගනු ලබන සම්පත් වශයෙනි.
5. ආවස්ථික පිරිවැයක් බිහි කිරීමට දායක නොවන යෙදවුම් වශයෙනි.

20. මූලික මිලට දළ දේශීය නිෂ්පාදනය රු.මි. 10000 ක් ද වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදනය රු.මි.12000 ක් ද නම් පහත කවර තත්වයක් එම වෙනසින් හෙළි වන්නේද?
1. ශුද්ධ වක්‍ර බද්දට සාපේක්ෂව ප්‍රාග්ධන පාරිභෝජන වියදම විශාල වේ.
2. ශුද්ධ වක්‍ර බද්දට ශූන්‍ය වන අතර ප්‍රාග්ධන පාරිභෝජනයක් තිබීම.
3. ශුද්ධ වක්‍ර බද්ධට සාපේකෂව ප්‍රාග්ධන පාරිභෝජනය අඩු අගයක් ගනී.
4. ප්‍රාග්ධන පාරිභෝජනය සහ ශුද්ධ වක්‍ර බද්ද සමාන වී ඇත.
5. ශුද්ධ වක්‍ර බද්ද සහ ප්‍රාග්ධන පාරිභෝජනය අතර සම්බන්ධ තාවයක් ප්‍රකාශ කළ නොහැකි වීම.

21. එක්තරා ආර්ථිකයක ජාතික ගිණුම් වලට අදාළ තොරතුරු පහත දැක් වේ. (සියළු සංඛ්‍ය රු.මි. වලිනි.)


ශුද්ධ අපනයන	- 305
සේවා ගිණුම	250
ප්‍රාථමික ආදායම් ගිණුම	- 380
ද්විතීයික ආදායම් ගිණුම	- 1300
දළ දේශීය වියදම	10000

ඉහත ආර්ථිකයේ වෙළෙඳ මිලට දළ ජාතික ආදායම වනුයේ,

1. රු.මි. 5270 2. රු.මි. 5670 3. රු.ම. 6190 4.රුමි.6570 5.රු.මි. 1330

22. කල්පිත ආර්ථිකයක වෙළෙඳ මිටල දළ දේශීය නිෂ්පාදනය රු.මි 2400 ක් විය. එහි දළ දේශීය වියදම රු.මි 2800 ක් නම් පැවතිය හැකි නිවැරදි විදේශ වෙළෙඳ වටිනාකම් දැක්වෙන වරණය කවරක්ද?
1. අපනයන රු.මි. 600 ක් ද ආනයන රු.මි. 900ක් ද වේ.
2. අපනයන රු.මි. 1000 ක් ද ආනයන රු.මි. 600ක් ද වේ.
3. අපනයන රු.මි. 500ක් ද ආනයන රු.මි. 900ක් ද වේ
4. අපනයන රු.මි. 7000ක් ද ආනයන රු.මි. 500ක් ද වේ
5. අපනයන රු.මි. 1000ක් ද ආනයන රු.මි. 800ක් ද වේ

23. පහතින් සපයා ඇති පාරිභෝජන රේඛාව ට අනුව නිවැරදි පාරිභෝජන ශ්‍රිතය වන්නේ,



1. C = 40 + .06yd 2. C = 40 + .075yd 3. C = -40 + 0.8yd
4. C = 40 + .08yd 5. C = 50 + 08yd


24. සාර්ව ආර්ථිකයක පාරිභෝජන ශ්‍රිතය C = 200 + 0.8yd වන අතර ආයෝජනය රු.මි. 300 ක් හා රාජ්‍ය මිලදී ගැනීම් රු.මි. 100 ක් වේ. මෙම ආර්ථිකයේ බදු අය කිරීම රු.මි. 50 කි. ඉහත තොරතුරු අනුව මෙම ආර්ථිකයේ කාන්දුවීම් වල වටිනාකම වනුයේ.

1. රු.මි. 450 කි 2. රු.මි. 400 කි 3. රු.මි. 360 කි 4. රු.මි. 460 කි 5. රු.මි. 280 කි

25. පාරිභෝජනය C = 20 + 0.8yd ද බද්ද T = 0.2y ආනයන M = 40 ද විය. ඒ අනුව ගිළිහීම් ශ්‍රිතය වන්නේ ,

1. W = 60 – 0.6y 2. W = 20 + 0.36y 3. W = - 20 + 0.2Y
4. W = 40 + 0.6y 5. W = - 60 + 0.36y

26.



ඉහත රූපසටහනට අනුව උද්ධමනකාරී තත්වයක් ඇති වීමට හේතු විය හැකි සාධකය මින් කුමක්ද?

1. සෘජු බදු නිදහස් සීමාව පහත දැමීම.
2. වක්‍ර බදු ප්‍රතිශතය ඉහළ දැමීම
3. ලෝක වෙළෙඳපලෙහි රන් මිල ගණන් ඉහළ යාම.
4. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයේ සුරැකුම් පත් මිලදී ගැනීම.
5. මහජනතාවගේ ඉන්ධන මිලදී ගැනීම පහත දැමීම.

27. ආසන්න මුදල් සඳහා වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ ,
    1. හුවමාරු මාධ්‍යක් ලෙස ක්‍රියාකරන එහෙත් අඩු ද්‍රවශීල තාවයක් පවතින මාධ්‍ය වේ.
    2. වටිනාකමේ සන්නිධයක් ලෙස ක්‍රියා කරන හුවමාරු මාධ්‍යක් ලෙස නොකරන මාධ්‍ය වේ.
    3. විලම්බිත ගෙවුම් මාධ්‍යක් ලෙස ක්‍රියා කරන ඉහළ ද්‍රවශීල තාවයක් පවතින මාධ්‍ය වේ.
    4. විනාකමේ මිනුමක් ලෙස ක්‍රියා නොකරන සහ හුවමාරු මාධ්‍යක් ලෙස ක්‍රියා කරන මධ්‍ය වේ.
    5. වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා නොකරන හුහමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා කරන මාධ්‍ය වේ.

28. 10 % ක ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයක් යටතේ කටයුතු කරන එක් වාණිජ බැංකුවක තැන්පතු රු.2000 ක්ද සංචිත රු.300 ක්ද සැපයූ ණය රු.1700 ක්ද විය. මෙම බැංකුවට අලුතින් සැපයිය හැකි ණය ප්‍රමාණය හා එම ණය සැපයූ වහාම බැංකුවේ මුළු තැන්පතු ප්‍රමාණය නිවැරදිව දැක් වෙන පිළිතුර කුමක්ද?

	අලුතින් සැපයිය හැකි ණය ප්‍රමාණය	ණය සැපයූ වහාම මුළු තැන්තු ප්‍රමාණය
1.	20000	22000
2.	10000	3000
3.	1000	3000
4.	100	2100
5.	100	2000

29. ඉල්ලුම් තැන්පතු රු.50000 ක් ද මුදල් සංචිත රු. 10000 ක්ද මවන ලද ණය රු.40000 ක්ද ලෙස පවතින අධි සංචිත ශූන්‍ය ව පැවති වාණිජ බැංකුවකට පුද්ගලයකු විසින් රු. 5000 ක නව තැන්පතුවක් සිදුකල විට බැංකුව තුළ පවතින අධි සංචිත වන්නේ,

1. රු.1000 කි. 2. රු.2000 කි. 3. රු.3000 කි. 4. රු.4000 කි. 5. රු. 5000 කි.

30. මූල්‍ය ප්‍රතිපත්තිය සඳහා නිවැරදි නිර්වචනය හා ඒ සඳහා නිවැරදි උපකරණයත් වනුයේ,

	නිර්වචනය	**උපකරණය**
1.	මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය ඇති කිරීම.	මුදල් සැපයුම
2.	මූල්‍ය ආයතන පාලනය හා අධීක්ෂණය	බැංකු පොළී අනුපාතය
3.	ලාභදායිත්වය හා ද්‍රවශීලතාව ආරක්ෂා කිරීම	විවට වෙළෙඳපොල කටයුතු
4.	මිල ස්ථායිතාවය සඳහා මුදල් සැපයුම හා පොළී අනුපාතිකය හැසිර වීම	ප්‍රතිපත්ති පොළී අනුපාතිකය
5.	සාර්ව ආර්ථික අරමුණු සඳහා බදු,රාජ්‍ය වියදම හා ණය ගැනිම් හැසිර වීම	රාජ්‍ය බදු

31. පොදු සම්පත් ලෙස අදහස් කරනුයේ ,
    1. සාමූහිකව පාරිභෝජනය කළ හැකි භාණ්ඩ වේ.
    2. පාරිභෝජයේ දී තරහ කාරීත්වයක් ඇති පාරිභෝජනය සීමා කළනොහැකි භාණ්ඩ වේ.
    3. පාරිභෝජනයේ දී තරහ කාරීත්වයක් නැති පාරිභෝජනය සීමා කළ හැකි භාණ්ඩ වේ.
    4. පාරිභෝජනයේ දී තරහ කාරීත්වයක් නැති ලෝක ප්‍රජාවට පාරිභෝජනය කළ හැකි භාණ්ඩ වේ.
    5. පාරිභෝජයේ දී ධන සමාජ ප්‍රතිලාභ අත්කර ගත හැකි භාණ්ඩ වේ.

32. සලකා බලන ආර්ථිකයක් තුළ රාජ්‍ය ආදායම් මට්ටම නොවෙනස්ව පවතින අවස්ථාවක දි රාජ්‍ය ඉතුරුම් පහළ වැටීමත් රාජ්‍ය ආයෝජන සිමා වීමත් සිදුව තිබේ.එයට හේතු විය හැකි සාධකය කුමක්ද?
    1. බදු ආදායම වැඩි වීම.
    2. වර්තන වියදම් ඉහළ යාම
    3. රාජ්‍ය ණය පොළී පහත වැටීම
    4. කුටුම්බ සඳහා වර්තන සංක්‍රම සීමා කිරීම
    5. රාජ්‍ය සේවක වැටුප් නොවෙනස්ව තවදුරටත් පවත්වා ගෙන යාම.

33. කිසියම් ආර්ථිකයක රාජ්‍ය මුල්‍ය තොරතුරු පහත දැක්වේ.ඒ අනුව නිවැරදි පිළිතුර තෝරන්න.

රාජ්‍ය අයභාරය	4000	වර්තන පැවරුම්	500
රජයේ මුළු වියදම	6200	දේශීය බැංකු නොවන ණය	200
වර්තන වියදම්	2700	විදේශ ණය	900
භාණ්ඩ හා සේවා වියදම්	1000		


	සමස්ථ අයවැය ශේෂය	වර්තන ගිණුමේ ශේෂය	පොළී ගෙවීම්	ප්‍රසාරණාත්මක බල පෑම
1.	–1200	1800	2000	900
2.	– 1700	1300	1200	600
3.	–2700	1500	1000	600
4.	– 1800	800	1300	900
5.	–1700	1000	800	600

34. ශ්‍රී ලංකා රජය ඛනිජතෙල් නිෂ්පාදනය මත පනවන බද්ද වැඩි කරන ලදි.මෙම ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ඔබට එකඟ විය හැකි ප්‍රකාශය වන්නේ,
1. සාධාරණ බව මූලධර්මයට අනුකූල වේ.මක් නිසාද යත් අනුක්‍රමික ලක්ෂණ බදු ව්‍යුහයට ඇතුළත් වන බැවිනි.
2. සාධාරණ බව මූලධර්මයට පටහැනි වේ. මක් නිසාද යත් සමානුපාතික ලක්ෂණ බදු ව්‍යුහයට ඇතුළත් වන බැවිනි.
3. සාධාරණ බව මූලධර්මයට අනුකූල වේ. මක් නිසාද යත් ප්‍රතික්‍රමික ලක්ෂණ බදු ව්‍යුහයට ඇතුළත් වන බැවිනි .
4. සාධාරණ බව මූලධර්මයට පටහැනි වේ. මක් නිසාද යත් ප්‍රතික්‍රමණ ලක්ෂණ බදු ව්‍යුහයට ඇතුළත් වන බැවිනි.
5. සාධාරණ බව මූලධර්මයට පටහැනි වේ. මක් නිසාද යත් අනුක්‍රමික ලක්ෂණ බදු ව්‍යුහයට ඇතුළත් වන බැවිනි.

35. මෑතකාලීන රාජ්‍ය වියදම් පිළිබඳ සැලකීමේ දී රජයේ පුනරාවර්තන වියදම් සංයුතියේ වැඩිම දායකත්වයක් සපයන සංරචකය වන්නේ,

1. පොළී ගෙවීම් වේ.
2. වැටුප් හා වේතන වේ.
3. කුටුම්බ වෙත පැවරුම් වේ.
4. අස්වැසුම දීමනා වේ.
5. විශ්‍රාම වැටුප් වේ.

36.



A හා B රටවල් දෙකට අදාළ නිෂ්පාදන හැකියා වක්‍ර ඉහත රූප සටහනේ පෙන්නුම් කරයි.දෙරටට ම තේ හා කුරුඳු නිපදවීමේ හැකියාව ඇත.ඒ අනුව පහත ප්‍රකාශ අතරින් එකඟ විය නොහැකි ප්‍රකාශය කුමක්ද?

1. A රටේ කුරුඳු නිපදවීමේ ආවස්ථික පිරිවැයත් B රටේ කුරුඳු නිපදවීමේ ආස්ථික පිරිවැයත් ස්ථාවර වේ.
2. දෙරටම කුරුඳු ඒකකයක් පදවීම සඳහා තේ ඒකක 0.5 ක් කැපකරයි.
3. දෙරටම තේ ඒකකයක් නිපදවීම සඳහා කුරුඳු ඒකක 2 ක් කැපකරයි.
4. A රටට සාපේක්ෂව B රටෙහි නිෂ්පාදන හැකියාව වැඩිය.
5. A රට කුරුඳු සහ B රට තේ සාපේක්ෂ වාසි ලබයි.

37. තිරුබඳු ආරක්ෂණයේ අහිතකර ප්‍රතිවිපාකයක් නොවන්නේ කුමක්ද?
1. වෙළෙඳපොල සංකෝචනය වීම.
2. දියුණු තාක්ෂණය සංක්‍රමණය නොවීම.
3. ජාතික ආදායම පහළ වැටීම.
4. ආයතන තරහකාරීත්වය අඩුවීම.
5. දේශීය පාරිභෝගිකයාගේ පාරිභෝජන පිරිවැය ඉහළ යාම.

38. සලකා බලන ආර්ථිකයක භාණ්ඩ වෙළෙඳ අනුපාතය 80 ක් විය. අපනයන මිල 20% කින් පමණ වැඩි වී තිබේ නම් ආනයන මිල දර්ශකය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
    1. ආනයන මිල 150% කින් වැඩි වී තිබේ.
    2. ආනයන මිල 50% කින් වැඩි වී තිබේ.
    3. ආනයන මිල 75% කින් වැඩි වී තිබේ.
    4. ආනයන මිල 80% කින් වැඩි වී තිබේ.
    5. ආනයන මිල 60% කින් වැඩි වී තිබේ.

39. 2022 දී මෙන්ම 2023 දීත් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයන මූලය ලෙස ඉන්දියාව හා චීනය පැවති අතර තෙවන ආනයන මූලය ලෙස වඩාත් නිවැරදි වන්නේ,
    1. 2022 දී මැලේසියාව ද 2023 දී සිංගප්පුරුවද වේ.
    2. 2022 දී සිංගප්පුරුව ද 2023 දී එක්සත් අරාබි එමීර් රාජ්‍යය ද වේ.
    3. 2022 දී මැලේසියාව ද 2023 දී එක්සත් අරාබි එමීර් රාජ්‍යය ද වේ.
    4. 2022 දී ජපානය ද 2023 දී මැලේසියාව ද වේ.
    5. 2022 දී තායිලන්තය ද 2023 දී සිංගප්පුරුව ද වේ.

40. එක් මුදල් වර්ගයක මිල තවත් මුදල් වර්ගයකින් ප්‍රකාශ කිරීම නාමික විනිමය අනුපාතිකය වේ.එය ප්‍රකාශ කළ හැකි ආකාර දෙකකි.එයින් ඍජු කියවීම යනු කුමක්ද?
    1. විදේශ මුදල් ඒකකයක මිල දේශීය මුදල් ඒකක වලින් දැක් වීමයි.
    2. දේශීය මුදල් ඒකකයක මිල විදේශ මුදල් ඒකක වලින් දැක්වීමයි.
    3. රජය විසින් නියම කරන ලද විදේශ විනිමය අනුපාතිකයක් වේ.
    4. රජය මැදිහති වීමකින් තොරව තීරණය වන විදේශ විනිමය අනුපාතිකයකි.
    5. භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු වන ආකාරයේ වෙළෙඳපොල අවස්ථාවකි.

41. කල්පිත ආර්ථිකයක ගෙවුම් ශේෂ ලේඛනයක සංරචක කීපයක් පහත දැක්වේ.

වෙළෙඳ ගිණුම ශුද්ධ	- 1200
සේවා ගිණුම ශුද්ධ	500
ප්‍රාථමික ආදායම් ගිණුම ශුද්ධ	- 300
ද්විතීයික ආදායයම් ගිණුම ශුද්ධ	800
ප්‍රාග්ධන ගිණුම ශුද්ධ	100

මෙම තොරතුරු අනුව මුල්‍ය ගිණුමේ ශේෂය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

1. – 200 2. – 100 3. 0 4. 100 5. 200

42. පහත දැක්වෙන අයිතම අතුරෙන් විදේශ වත්කම් සංයුතියට අයත් සංරචකයක් නොවන්නේ.
    1. මහ බැංකුවට අයත් විදේශ බැංකු තැන්පතු.
    2. මහ බැංකුව මිලදි ගත් විදේශ සුරැකුම්පත්.
    3. වාණිජ බැංකු මිලදී ගත් විදේශ සුරැකුම්පත්.
    4. ශ්‍රී ලංකා රජය සතු විශේෂ ගැණුම් හිමිකම්.
    5. මහජනයා විසින් මිලදීගත් රජයේ සුරැකුපත්

43. ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ ප්‍රමාණාත්මක ඉලක්ක අතුරින් මුල්‍ය අවශ්‍යතා සලකන විට එය 2027 සිට 2032 කාලය තුළ මධ්‍යම රජයේ වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතාවයට සාමාන්‍ය දළ දේශීය නිෂ්පාදිතයෙන්,
    1. 10% කට වඩා අඩුමට්ටක් පවත්වා ගත යුතුය.
    2. 13% කට වඩා අඩුමට්ටක් පවත්වා ගත යුතුය.
    3. 16% කට වඩා අඩුමට්ටක් පවත්වා ගත යුතුය.
    4. 20% කට වඩා අඩුමට්ටක් පවත්වා ගත යුතුය.
    5. 33% කට වඩා අඩුමට්ටක් පවත්වා ගත යුතුය.

44. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සලකන විට ආසන්නතම වර්ෂ පහක් සැලකීමේ දී එයින් හතරක දීම ආර්ථික වර්ධන වේගය ඍණ අගයක් ගනී.පහත වර්ෂ අතරින් ආර්ථික වර්ධන වේගය ධන අගයක් වාර්තා කළ වර්ෂය කුමක්ද?

1. 2019 2. 2020 3. 2021 4. 2022 5. 2023

45. දෙන ලද කාලපරිච්ඡේදයක් තුළ රටක මූර්ත දළ දේශීය නිෂ්පාදනය හා ප්‍රතිශීර්ෂ ආදායමේ ඉහළයාමත් සිදු වුවත් එරට සංවර්ධනය ඇති කර ගෙන නැතැයි පැවසීමට හෙතු විය හැක්කේ කවර තත්වයක් නිරීක්ෂණය වේ නම්ද?

A - දිළිඳු බව B - ආයම් විෂමතාව C - ඉතිරි කිරීම් අඩු වීම D - විරැකියාව

1. A ,B සහ C 2. A ,C සහ D 3. A ,B සහ D 4. B ,C සහ D 5. C සහ D

46. වැරදි සම්බන්ධතාවය හඳුනා ගන්න.

	ලොරන්ස් වක්‍රය	ගිනි සංගුණකය	ආදායම් විෂමතාව
1	සම ව්‍යාප්ති රේඛාව මත පිහිටයි	ශූන්‍ය වේ	උපරිම වේ
2	සම ව්‍යාප්ති රේඛාවට ආසන්නවේ	ශූන්‍ය ට ආසන්නවේ	අඩුවේ
3	සම ව්‍යාප්ති රේඛාවෙන් දුරස් වේ	එකට ආසන්න වේ	වැඩි වේ
4	සම ව්‍යාප්ති රේඛාව මත පිහිටයි	ශූන්‍ය වේ	ශූන්‍ය වේ
4	සම ව්‍යාප්ති රේඛාවෙන් සම්පූර්ණයෙන්ම දුරස්වේ	එකකි	උපරිම වේ

47. අස්වැසුම නමින් දුගීබව පිටු දැකීම සඳහා නව වැඩ පිළිවලක් රටට හඳුන්වා දී තිබේ. ඊට අනුව අඩු ආදායම් ලාභීන් කාණ්ඩ කර ඇත. එම කාණ්ඩ ගණන වන්නේ,

1. 2 කි. 2. 4 කි. 3. 5 කි. 4. 8 කි. 5. 9 කි.

48. කිසියම රටක සඳහා අදාළ වන ප්‍රජා විද්‍යාත්මක දත්ත කිහිබයක් පහත දැක්වේ.

සජීවී උපත් සංඛ්‍යාව	1000
මරණ සංඛ්‍යාව (1000කට)	250
ශුද්ධ සංක්‍රමණ (1000කට)	-150
මධ්‍ය වාර්ෂික ජනගහනය	100000

මෙම රටේ ස්භාවික වර්ධන අනුපාතිකය හා ජනගහන වර්ධන අනුපාතිකය වන්නේ.

1. ස්භාවික වර්ධන අනුපාතිකය 1.25 ක් හා ජනගහන වර්ධන අනුපාතිකය 1.10 ක් වේ.
2. ස්භාවික වර්ධන අනුපාතිකය 0.85 ක් හා ජනගහන වර්ධන අනුපාතිකය 0.75 ක් වේ.
3. ස්භාවික වර්ධන අනුපාතිකය 0.75 ක් හා ජනගහන වර්ධන අනුපාතිකය 0.6 ක් වේ.
4. ස්භාවික වර්ධන අනුපාතිකය 1.25 ක් හා ජනගහන වර්ධන අනුපාතිකය 0.6 ක් වේ.
5. ස්භාවික වර්ධන අනුපාතිකය 0.75 ක් හා ජනගහන වර්ධන අනුපාතිකය 0.25 ක් වේ.

49. ශ්‍රී ලංකාවේ පවත්නා දරිද්‍රතාවය අවම කිරීම සඳහා අලුතෙන් පත්වන රජයක් අවධානය ලබාදෙනු ඇතැයි සිතමු. එහි දී ගත හැකි ක්‍රියා මාර්ග කිහිපයක් පහත දක්වා ඇත. එම අරමුණට නොගැළපෙන ක්‍රියා මාර්ගය ඒ අතුරින් කුමක් වේද?

1. යටිතල පහසුකම් සැපයීම.
2. කුඩා පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීම.
3. ඵලදායි සුබසාධක වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
4. රැකියා අවස්ථා සිමා කිරීමට කටයුතු කිරීම.
5. අධ්‍යාපන හා සෞඛ්‍ය අවස්ථා පුළුල් කිරීම.

50. නැගෙනහිර ආසියානු රටවල් සමඟ සසඳන විට ගෝලීය වෙළෙඳාම තුළ ශ්‍රී ලංකාව අත් කරගෙන ඇති ප්‍රමාණය කාලයත් සමඟ පහත වැටීමට තුඩුදුන් ප්‍රබලතම සාධකය ලෙස සැලකිය හැක්කේ මින් කුමක්ද?

1. අපනයන විවිධාංගීකරණයට අපොහොසත් වීම.
2. ආනයනික යෙදවුම් මත දැඩි ලෙස රදා පැවතීම.
3. තේ කර්මාන්තය පෞද්ගලික අංශය අතට පත්වීම.
4. අධික මිල උද්ධමනය.
5. ශ්‍රම වෙළෙඳපොල තුළ පවතින අසමතුලිතතා.

*****

උඟ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	21	S	II	ආර්ථික විද්‍යාව II Economics II	කාලය : පැය තුනයි Time : Three hours

උපදෙස් :

- එක් එක් කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන මුළු ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(අ) උප කොටස

(01). (i). ආර්ථික නොවන භාණ්ඩ ආර්ථික නොවන සම්පත් වලින් වෙනස් වන්නේ කෙසේ ද?

(ලකුණු 04)

(ii). නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය විතැන්වීම හා නිෂ්පාදන හැකියා මායිම් එක් ලක්ෂ්‍යයක් විතැන් වීම එකිනෙකට වෙනස් තත්ත්වයන් වේ. පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii). සම්පත් කාර්යක්ෂමව භාවිතා කරනු ලබන ආර්ථිකයකට නිෂ්පාදන හැකියා වක්‍රය මත එක් වරකට තෝරාගත හැක්කේ එක් භාණ්ඩ සංයෝගයක් පමණි. මෙම ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(iv). විධාන ආර්ථිකයක සාධනීය ලක්ෂණ මෙන්ම එහි දුර්වලතා ද පවතින බව ප්‍රකාශවේ. එවැනි සාධනීය තත්ත්ව හා දුර්වලතා 2 බැගින් දක්වන්න.

(ලකුණු 04)

(v). ආර්ථිකයක් පූර්ණ සේවා නියුක්ති තත්ත්වයක පවතින බව සඳහන් කරනු ලැබුවද එහි දී විරැකියා මට්ටම ශූන්‍ය අගයක පවතියි යැයි කිව නොහැක. එකඟ වන්නේද? හේතු දක්වන්න.

(ලකුණු 04)

(02). (i). ඉල්ලුම හා සළුල ඉල්ලුම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii). කිසියම් වෙළඳපොළකට අදාල තොරතුරු පහත දැක්වේ.

QS= -100 + 10P

සමතුලිත ප්‍රමාණය = 200 (ඒකක)

පරිභෝගික අතිරික්කය = රු. 2000/=

ඉහත තොරතුරු මගින් පහත දෑ ගණනය කරන්න.

(a). සමතුලිත මිල කොපමණ ද? (ලකුණු 02)

(b) සමතුලිත මිලේදී සැපයුම් නම්‍යතව කොපමණ ද? (ලකුණු 02)

(c). ඉල්ලුම් ප්‍රමාණය ශූන්‍ය වන මිල කොපමණද? (ලකුණු 02)

(iii). පහත සඳහන් භාණ්ඩ වර්ග ඔබ හඳුනාගන්නේ කෙසේද?

(a). X හා Y භාණ්ඩ අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාව + 1 ට අඩු අගයක් ගැනීම.

(b). ආදායම් ඉල්ලුම් නම්‍යතාව (+) හා මිල ඉල්ලුම් නම්‍යතාව (-) අගයක් ගන්නා භාණ්ඩ.

(c). මිල ඉල්ලුම් නම්‍යතාව (-) හා ආදායම් ඉල්ලුම් නම්‍යතාව (-) අගයක් ගන්නා භාණ්ඩ.

(d). මිල ඉල්ලුම් නම්‍යතාව (+) අගයක් හා ආදායම් ඉල්ලුම් නම්‍යතාව (-) අගයක් ගන්නා භාණ්ඩ

(ලකුණු 1 × 4 = 4)

(iv). සැපයුම් චක්‍රයක් පහල සිට ඉහලට බෑවුම් වන්නේත්, ඉල්ලුම් චක්‍රයක් ඉහළ සිට පහලට බෑවුම් වන්නේත් ඇයි දැයි හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. (i). වෙළඳපොළට රජය මිල පාලනය මගින් මැදිහත් වීමේදී ආර්ථික අතිරික්කයේ අඩුවීමක් හා සමාජ සුභසාධනයේ අහිමි වීමක් නිර්මාණය වන්නේ ඇයි? (ලකුණු 4)

(ii). රජය වෙළඳපොළ ක්‍රියාකාරීත්වයට මැදිහත්වන විට සමාජය අපේක්ෂා කරන නිමැවුම් ප්‍රමාණය ඉක්මවා වෙළඳපොළ තුළ නිමවුමක් පැවතිය හැක්කේ කුමන අවස්ථාවලදී ද? ප්‍රස්තාර සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii). තරගකාරී සීනි වෙළඳපොළකට අදාළ තොරතුරු පහත දැක්වේ.

Qd = 480 – 6p (ඉල්ලුම් සමීකරණය)

Qs = -60 + 2p (සැපයුම් සමීකරණය)

ඉහත තොරතුරු ඇසුරෙන් පහත දෑ ගණනය කරන්න.

(a). ඉල්ලුම් හා සැපසුම් චක්‍ර යොදාගනිමින් සමතුලිත තත්ත්වය ප්‍රස්තාරයක දක්වා සමතුලිනයේ දී නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 04)

(b). රජය සීනි 1kg සඳහා රු.60 ක උපරිම මිලක් නියම කරන ලදි.එය ප්‍රස්ථාරයේ ලකුණු කර උපරිම මිල යටතේ සපයනු ලබන ප්‍රමාණය පමණක් වෙළඳපොළ තුල පවතී නම් උපරිම මිලෙන් පසු

1). පාරිභෝගික අතිරික්කය

2). නිෂ්පාදන අතිරික්කය

3). අහිමිවන සුභසාධනය ගණනය කරන්න.

(ලකුණු 1 x 4 = 4)

(iv). නිෂ්පාදන සහනාධාරයක් සපයා ඇති විටෙක වෙළඳපොළ ආර්ථික අතිරික්කයේ ඉහළයාමක් සිදුවූවද අහිමිවන සුබසාධනයක් ද ගොඩනැගෙන්නේ ඇයිදැයි ප්‍රස්තාරිකව පැහැදිලි කරන්න.

(ලකුණු 04)

04. (i). පහත සඳහන් සිදුවීම් නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන ආන්තික පිරිවැය හා මුළු ස්ථාවර පිරිවැය කෙරෙහි බලපාන ආකාරය දක්වන්න.

(a). බලපාත්‍ර ගාස්තු 50% කින් ඉහළයාම.


(b). අමුද්‍රව්‍ය පිරිවැය 10% කින් අඩුවීම.

(c). ණය පොළී අනුපාතිකය 1% කින් පහළ යාම (ලකුණු 1 × 3 = 3)

(ii). හීන වන ආන්තික ඵලදාව හා හීනවන පරිමාණානුකූල ඵල යන සංකල්ප එකිනෙකට වෙනස් වන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii). පූර්ණ නරගකාරී ආයතනයකට මෙන්ම කතිපයාධිකාරී වෙළඳපොළක එක් ආයතනයකට වෙළඳපොළ මිල වෙනස් කළ නොහැකි වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv). පහත දැක්වෙන්නේ පූර්ණ තරගකාරී වෙළඳපොළක කටයුතු කරන එක් ආයතනයක කෙටිකාලීන හැසිරීමයි.



පහත ප්‍රශ්න වලට පිළිතුර සපයන්න.

(a). මෙම ආයතනය නිෂ්පාදනය වසා දමන්නේ වෙළඳපොළ කවර මිලකදී ද? (ලකුණු 01)

(b). ඒකක 100 නිපදවන්නේ නම් ආර්ථික අලාභය කොපමණද? (ලකුණු 01)

(c). ආයතනය නිෂ්ප්‍රාමාණික ලාභ උපයන්නේ කවර මිලකදී ද? එම ලාභය කොපමණ ද? (ලකුණු 02)

(d). ආර්ථික ලාභය ශූන්‍ය වන්නේ කවර මිලක දී ද? (ලකුණු 01)

(v). නිෂ්පාදන සාධකයක ඉපැයුම ආර්ථික බදුකුලී හා සංක්‍රාම ඉපැයුම් ලෙස ගොඩනැගේ. නමුත් සම්පූර්ණ ඉපැයුම සංක්‍රාම ඉපැයුම් වලින් හෝ ආර්ථික බදුකුලී ලෙස පමණක් පැවතිය හැකි අවස්ථා ද පවතියි. රූප සටහන් යොදාගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

05. (i). ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්භ වෙත සේවා සපයන ආයතන නිෂ්පාදන ඉමට ඇතුලත් වුවද ඔවුන් නිපදවන භාණ්ඩ හා සේවා වෙළඳපොළ මිල මගින් තක්සේරු කළ නොහැක. එම නිමවුම් වටිනාකම ජාතික ගිණුම්වලදී තක්සේරු කරන්නේ කෙසේද? (ලකුණු 04)

(ii). පහත සඳහන් ගණුදෙනු දල දේශීය නිෂ්පාදනයට සිදුකරන බලපෑම පැහැදිලි කරන්න.

(a). චීන ජාතිකයෙක් ලංකාවේ කොටස් පෙළඳපොළෙන් රුපියල් මිලියන 100 ක් වටිනා ව්‍යාපාර කොටස් මිලට ගැනීම.

(b). ශ්‍රී ලාංකික කාන්තාවක් සෞදි අරාබියේ ගෘහසේවයෙන් උපයාගත් මුදල් තම පවුලේ ඥාතීන් වෙත එවීම.

(c). දේශීය ආයෝජකයෙක් තම ව්‍යාපාර කටයුතු සඳහා නව ගොඩනැගිල්ලක් මිලට ගැනීම.

(d). ශ්‍රී ලංකාවේ වෛද්‍ය පර්යෝෂණ ආයතනය පිළිකා මර්දනය සඳහා නව එන්නතක් නිපදවා එහි පේටන්ට් අයිතිය ලබාගැනීම.

(ලකුණු 1 × 4 = 4)

(iii). කල්පිත ආර්ථිකයකට අදාල ජාතික ආදායම් ගිණුම් දත්ත පහත දැක්වේ.

අයිතමය	**රුපියල් මිලියන**
කුටුම්භයක අවසාන පාරිභෝජන වියදම	1500
අවශේෂ ලෝකයෙන් ලැබුණු දේපල ආදායම්	200
විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම	500
අවශේෂ ලෝකයට ගෙවූ දේපල ආදායම්	300
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය	250
තොග වෙන්ස්වීම්	50
ස්ථාවර ප්‍රාග්ධන පාරිභෝජනය	100
ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්භ වෙත සේවා සපයන ආයතනව පාරරියෝජන වියදම	250
භාණ්ඩ හා සේවා මිලට ගැනීමේ රජයේ වර්තන වියදම	750
භාණ්ඩ හා සේවා අපනයන	200
භාණ්ඩ හා සේවා ආනයන	400

මෙම දත්ත සැලකිල්ලට ගෙන පහත දෑ ගණනය කරන්න.

(a). වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදනය (ලකුණු 01)

(b). වැය කළ හැකි ජාතික ආදායම (ලකුණු 02)

(c). දේශීය හා ජාතික ඉතුරුම් (ලකුණු 02)

(iv). $S = -200 + 0.2Y$ යන ඉතුරම් සමීකරණය යොදාගෙන ආදායම ඉහළ යන විට ආන්තික ඉතුරුම් නැමියාව (MPS) හා සාමාන්‍ය ඉතුරුම් නැමියාව (APS) අතර සම්බන්ධතාව පහැදිලි කරන්න.
(ලකුණු 03)

(v). කල්පිත ආර්ථිකයකට අදාළ දත්ත පහත දැක්වේ සංඛ්‍යා රුපියල් මිලියන වලින්

කුටුම්භ පාරිභෝජනය (C) = 200 + 0.75 yd

දළ ආයෝජනය (I) = 250

රජයේ වියදම (G) = 150

පහත දෑ ගණනය කරන්න.

(a). ආර්ථිකයේ සමතුලින ජාතික ආදායම (ලකුණු 01)

(b). සමතුලින අවස්ථාවේ ඉතිරි කිරීම (ලකුණු 01)

(c). රජය බදු රුපියල් මිලියන 100 කින් වැඩිකර රාජ්‍ය වියදම ද රුපියල් මිලියන 100 කින් වැඩිකළහොත් සමතුලින ජාතික ආදායමට සිදුවන බලපෑම (ලකුණු 02)

ආ උපකොටස

06. (i). නිෂ්පාදන මිල දර්ශකය හා ජාතික පාරිභෝගික මිල දර්ශකය අතර වෙනස දක්වන්න.

(ලකුණු 03)

(ii). ශ්‍රී ලංකා ආර්ථිකයේ කල්පිත වර්ෂයක් සඳහා මුදල් සැපයුම ආශ්‍රිතව පහත තොරතුරු ඔබට ඉදිරිපත් කර ඇත.

අයිතමය	රු. මිලියන
මහජනයා සතු ව්‍යාවහාර මුදල්	6000
මහජනයා සතු ඉල්ලුම් තැන්පතු	14000
වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු	30000
මහබැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු	300
පුළුල් මුදල් ගුණකය	4
ඒකාබද්ධ පුළුල් මුදල් ගුණකය	5

පහත දෑ ගණනය කරන්න.

(a). පදනම් මුදල් ප්‍රමාණය (ලකුණු 01)

(b). ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම් ප්‍රමාණය (ලකුණු 01)

(c). දේශීය තැන්පතු ලෙස හඳුනාගත් නේවාසික හා අනේවාසික කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණය. (ලකුණු 02)

(iii). කල්පිත ආර්ථිකයක මුදල් සැපයුම රු. ම. 7900 කි. මහජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය රු.මි. 3200 කි. වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යන සංචිත ප්‍රමාණය රු. 470 කි. මෙම බැංකු පද්ධතියේ අධි සංචිත ශූන්‍ය වේ.

(a). තැන්පතු ප්‍රසාරණ සංගුණකය හා මෙම බැංකුව ලබාදී ඇති මුළු ණය ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

(b). මහ බැංකුව මෙම බැංකු පද්ධතියට රු. මි. 70 ක භණ්ඩාගාර බිල්පත් අලෙවි කළේ නම් සමස්ත තැන්පතුවලට කරන බලපෑම කොපමණද? (ලකුණු 02)

(c). බිල්පත් අලෙවියෙන් පසු අර්ථිකයේ මුදල් සපයුමට කෙසේ වෙනස්වේද? (ලකුණු 02)

(iv). ශ්‍රී ලංකාවේ මෑත කාලයේ (2024 අවසන් වනවිට) දක්නට ලැබුනේ අවධමනය හෙවත් ඍණ උද්ධමන තත්ත්වයකි. එහි ආර්ථික ප්‍රතිවිපාක 2ක් දක්වා මහ බැංකුව එම තත්ත්වය ඉවත් කිරීමට මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගන්නේ කෙසේදැයි දක්වන්න. (ලකුණු 04)

(අ). ශ්‍රී ලංකාව මහ බැංකුව 75 වන සංවත්සරය සැමරීම වස් රු. 2000 නව මුදල් නෝට්ටු මිලියන 20 ක් නිකුත් කළේය. එහි ආර්ථික ප්‍රතිවිපාක 3ක් ලියන්න. (ලකුණු 03)

07. (i). ''වෙළඳපොළ ආර්ථික ක්‍රමයක ආණ්ඩුව බහුවිධකාර්ය භාරයක් ඉටුකරයි.'' යන ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii). සුභ සාධන භාණ්ඩ නිෂ්පාදනයේදී මෙන්ම පාරිභෝජනයේදී ද ඌණතාවයන් පවතින ආකාරය රූප සටහන් යෙදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii). රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් බිහිකිරීම සඳහා මෑත කාලීන රජය විසින් දක්වන කැපවීම පිළිබිඹු කරමින් අයවැය හිඟය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගැනීමට හැකි වී ඇත. ඒ සඳහා රජය අනුගමනය කළ ක්‍රියා මාර්ග මොනවාද? (ලකුණු 04)

(iv). සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්තියක් ලෙස බදු ප්‍රතිසංස්කරණයේ වාසි 2ක් හා අවාසි 2ක් දක්වන්න.

(ලකුණු 02)

(v). රජයේ වර්තන ව්‍යයමේ සංරචක 2ක් දක්වන්න. (ලකුණු 02)

08. (i). විදේශ වෙළඳාමේදී රටකට සාපේක්ෂ වාසි බිහිවීමට හේතුවන සාධක ස්ථතික හා ගතික වශයෙන් වර්ග කරන්නේ කෙසේද? (ලකුණු 04)

(ii). පසුගිය වර්ෂ දෙකකම අධික කාලයක් ලංකා රජය විසින් දැඩි ආනයන පාලන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළේය. මෙහි වාසි සහ අවාසි 3 බැගින් දක්වන්න. (ලකුණු 06)

(iii). පහත සඳහන් ගනුදෙනු ගෙවුම්ශේෂ ලේඛනයක ද්විත්ව සටහන් මූලධර්මය අනුව සටහන් කරන්නේ කෙසේද?

(a). ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ වෙළඳපොළේ පිළිණපත් අලෙවි කර ඩොලර් මිලියන 100ක් උපයා ගැනීම.

